ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2018/11 - 2017 මැයි මස 09 වැනි අඟහරුවාදා - 2017.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 31(ඊ) වගන්තිය අනුව පිහිටුවන ලද වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලින් ත්‍යාග ගෙවීම් කිරීමේ මාර්ගෝපදේශ හා උපමාන**

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 31(ඊ) (1) වගන්තිය යටතේ ''වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල'' නමින් අරමුදලක් පිහිටුවා ඇත. එම අරමුදලට බැරවන මුදලින් ත්‍යාග ගෙවීම් කිරීමටත් සකස් කර ඇති පහත සඳහන් මාර්ගෝපදේශ හා උපමාන පරිදි අදාළ ත්‍යාග මුදල් ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

මෛත්‍රීපාල සිරිසේන,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය.

2017 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ දී ය.

**1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 31(ඊ) වගන්තිය අනුව පිහිටුවන ලද වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලින් ත්‍යාගයක් ගෙවීම් කිරීමේ යෝග්‍යතාවය සඳහා සුදුසුකම් නිශ්චය කිරීම සඳහා වන මාර්ගෝපදේශ**

1. ත්‍යාග ලබා ගැනීමට සුදුසුකම් ලබන පුද්ගලයන්.

   (i) පොලිස් නිලධාරීන්.
   (අදාළ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම හා අධිකරණයට ඉදිරිපත් කිරීම් සිදුකළ පොලිස් නිලධාරීන් හා අදාළ නඩු කටයුත්ත මෙහෙය වූ හා සාක්ෂි ලබා දුන් පොලිස් නිලධාරීන්)

   (ii) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්.
   (අදාළ අනවසර ක්‍රියාව සම්බන්ධව පොලීසියට පැමිණිලි සිදුකළ අය, අදාළ නඩු කටයුත්තට සාක්ෂි ලබා දුන් අය හා අදාළ නඩු කටයුත්ත සඳහා අධිකරණයේ දී දෙපාර්තමේන්තුව වෙනුවෙන් කරුණු දක්වන ලද නිලධාරීන්).

   (iii) අධිකරණයේ නඩු කටයුත්ත මෙහෙය වීමට, සැකකරුවන් අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුමකට හෝ නඩු කටයුත්තකට සාක්ෂි ලබා දුන් අනෙකුත් රජයේ නිලධාරීන්.

   (iv) අදාළ අනවසර ක්‍රියාව සම්බන්ධව තොරතුරු ලබාදුන් පුද්ගලයින්.

1A - PG 3525 — 507 (2017/05)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2. අරමුදලට බැරවන මුදල් වෙන් කිරීම් සිදුකළ යුතු ආකාරය.**

* ඒකාබද්ධ අරමුදලට 40%
* ත්‍යාග සඳහා 50%
* අනිකුත් වියදම් 10%
(අනිකුත් වියදම් සඳහා වෙන් කරන මුදලින් 5% අරමුදලේ පරිපාලන කටයුතු සඳහා, ඉතිරි 5% වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ සුභසාධන කටයුතු සඳහා වෙන් කරනු ලැබේ.)

* සුභ සාධන කටයුතු සඳහා වෙන් කරන 5% වටිනාකමින් වාර්ෂිකව සුභ සාධනය සඳහා වියදම් කළ හැකි උපරිම මුදල රුපියල් ලක්ෂ දහයකි (රු. 1,000,000/-)

* ත්‍යාග සඳහා වෙන්කරන මුදලින් එක් අයෙකුට උපරිමව රු. 50,000/- වශයෙන් ත්‍යාග මුදල් ගෙවීමෙන් පසුව යම් මුදලක් ඉතිරිවේ නම් එම මුදලද අර්ධ වාර්ෂිකව ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වේ.

* යම් වර්ෂයක සුභ සාධනය සඳහා ද වෙන්කරන 5% ප්‍රමාණයෙන් රු. 1,000,000/- සුභ සාධනයට වෙන්කළ පසු යම් මුදලක් ඉතිරි වේ නම් එම මුදල ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු ය.

**3. ත්‍යාග ලබා දීමට සපුරාලිය යුතු හා සම්පූර්ණ කළ යුතු සුදුසුකම්.**

(i) යම් ත්‍යාගයක් ගෙවීමට පෙර එම විෂය ගත නඩුවට අදාළ සියළු දඩ මුදල් හෝ පනතේ විධිවිධාන යටතේ අහිමි කරන ලද භාණ්ඩ බැහැර කිරීමෙන් ලබාගන්නා සියළු මුදල් ප්‍රමාණය වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලට බැරවී තිබිය යුතු ය.

(ii) යම් නඩු කටයුත්තකට සහභාගී වූ පොලිස් නිලධාරියෙකුට හෝ රජයේ නිලධාරියෙකුට එක් නඩුවකට අදාළව ගෙවිය හැකි උපරිම ත්‍යාග මුදල රුපියල් පනස්දහසකි (රු. 50,000/-).

(iii) ත්‍යාග ගෙවීමට පෙර එම අත්අඩංගුවට ගැනීම සහ නඩු කටයුත්තට සහභාගී වූ පොලිස් නිලධාරීන්ගේ නාම ලේඛනය අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ අත්සනින් එවිය යුතුය. අදල වැරැද්ද සම්බන්ධව පොලිසිය වෙත පැමිණිලි ඉදිරිපත් කළ, හා තොරතුරු ලබා දුන් අයගේ නාම ලේඛනයද, නඩු කටයුත්තට සහභාගී වූ හා සාකෂි ලබාදීමට සහභාගී වූ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහ අනෙකුත් රජයේ නිලධාරීන්ගේ නාම ලේඛනය අදල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතික කළ යුතු ය.

**4. ත්‍යාග සඳහා මුදල් ගෙවීම් සිදුකළ යුතු ආකාරය**

(i) ත්‍යාග සඳහා වෙන කරන සියයට පනහක 50% මුදලින් පහත සඳහන් පරිදි ත්‍යාග ගෙවීම සිදුකළ යුතු ය.

| අනු. අංක | විස්තරය | පොලිස් නිලධාරීන්ට | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්/අනෙකුත් රජයේ නිලධාරීන් | තොරතුරු ලබා දුන් පුද්ගලයින්ට |
|---|---|---|---|---|
| (අ) | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පැමිණිල්ලක් හෝ නඩු කටයුත්තට පෙනී සිටීම හෝ සාක්ෂි දීමට හෝ වෙනත් සහභාගීත්වයක් නොමැතිව පොලිස් නිලධාරීන් විසින් පමණක් අදල කටයුත්තට මැදිහත් වී ඇති විට | 100% | නැත | නැත |
| (ආ) | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පැමිණිල්ලක් මත පොලිස් නිලධාරීන් අදල අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති විට සහ එම නඩු කටයුත්තට පෙනී සිටීම හෝ සාක්ෂි දීමට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයක් නොමැති විට | 70% | 30% | නැත |

| අනු. අංක | විස්තරය | පොලිස් නිලධාරීන්ට | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධරීන්/අනෙකුත් රජයේ නිලධාරීන් | තොරතුරු ලබා දුන් පුද්ගලයින්ට |
|---|---|---|---|---|
| (ඇ) | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පැමිණිල්ලක් මත පොලිස් නිලධාරීන් විසින් අදල අත්අඩංගුවට ගැනීම සිදු කර අධිකරණයේ නඩු පවරා ඇති විට එම නඩු කටයුතු සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අධිකරණයේ පෙනී සිට කරුණු දක්වීම් සිදුකර ඇත්නම් සහ/හෝ අධිකරණයේ සාක්ෂි දීමට රජයේ නිලධාරීන් සහභාගී වී ඇත්නම් | 50% | 50% | නැත |
| (ඈ) | මහජනතාවගෙන් ලැබෙන තොරතුරක් මත පොලිස් නිලධාරීන් විසින් අදල අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති විට (වෙනත් කිසිදු රජයේ නිලධාරීන් සහභාගී වී නොමැති විට) | 80% | නැත | 20% |
| (ඉ) | මහජනතාවගෙන් ලැබෙන තොරතුරක් මත පොලිස් නිලධාරීන් විසින් අදල අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති විට හා අදල නඩුව සම්බන්ධව වෙනත් රජයේ නිලධාරීන් සාක්ෂි/සහභාගී වී ඇති විට | 50% | 30% | 20% |

(ii) පොලිස් නිලධාරීන්ට ත්‍යාග සඳහා වෙන් කරන මුදල නඩු කටයුත්තකට සහභාගී වූ සියලුම පොලිස් නිලධාරීන්ට පමණක් සමාන කොටස් වලින් බෙද දෙන අතර අදල ත්‍යාග මුදල් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් අදල පොලිස් නිලධාරීන්ට සෘජුවම ගෙවනු ලැබේ.

(iii) අදල නඩු කටයුත්තට සහභාගී වූ සහ පැමිණිලි ඉදිරිපත් කල හා සාක්ෂි ලබා දුන් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා ඊට සහභාගී වූ වෙනත් රජයේ නිලධාරීන්ට ත්‍යාග සඳහා වෙන්කල මුදල සමාන කොටස් වලින් එම නිලධාරීන්ට ලබා දෙනු ලැබේ.

**5. ගෙවීම් කාර්යය පටිපාටිය**

(i) ත්‍යාග සඳහා ගෙවීම් අර්ධ වාර්ෂිකව සිදුකරනු ලැබේ.

(ii) ත්‍යාගයක් ගෙවීම සඳහා සුදුසුකම් ලබන අවම දඩ මුදල රුපියල් පන්දහසකි. (රු. 5,000/-)

05-703

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.